
# අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරඟ - 2019

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

බුද්ධි පරීක්ෂණය (කනිෂ්ඨ) දිස්ත්‍රික් තරඟ වටය

විභාග අංකය - ............................ කාලය - පැය 2 යි.

❖ 01 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) 

නම් වැඩිම අගයක් ඇති සංකේතය කුමක් ද?




2) ලෝචනාට සහෝදරයන් දෙදෙනෙක් හා සහෝදරියන් දෙදෙනෙක් සිටී. ලෝචනාගේ පවුලේ සිටින පිරිමි හා ගැහැණු ළමුන් ගණන වන්නේ.


(i) පිරිමි ළමුන් 2 ගැහැණු ළමුන් 2


(ii) පිරිමි ළමුන් 3 ගැහැණු ළමුන් 2

(iii) පිරිමි ළමුන් 2 ගැහැණු ළමුන් 3

(iv) පිරිමි ළමුන් 3 ගැහැණු ළමුන් 3

3) රූපය සම්පූර්ණ වීම සඳහා අවශ්‍ය කොටස තෝරන්න.






4) හිස්තැන් තුනට පිළිවෙළින් ගැළපෙන සංඛ්‍යා ඇතුළත් පිළිතුර තෝරන්න.


1, ...., 9, ...., 25, ...., 49

(i) 5. 20. 40. (ii) 4. 16. 36. (iii) 2, 16, 35, (iv) 6. 18. 36.

5) 4, 3, 8, 6, 9, 12, 16, 15, යන සංඛ්‍යා යම් ගුණයක් අනුව කොටස් දෙකකට වෙන් කළ හැකිය. නමුත් එක සංඛ්‍යාවක් එම කොටස් දෙකටම ගත හැකිය. එම සංඛ්‍යාව කුමක් ද?

(i) 9 (ii) 3 (iii) 12 (iv) 16


6) සමමිති රේඛා පමණක් ඇඳ ඇති රූපය තෝරන්න.




7) බස්රථයක සිටින පිරිමි මගීන් සංඛ්‍යාව ගැහැණු මගීන් සංඛ්‍යාව මෙන් දෙගුණයකි. මෙම බස්රථයට තවත් ගැහැණු මගීන් දහ දෙනෙකු නැගුණහොත් ගැහැණු හා පිරිමි මගීන් සංඛ්‍යාව සමාන වේ. එසේ නම් බස්රථයේ සිටින පිරිමි මගීන් සංඛ්‍යාව කොපමණ ද?


(i) 24 (ii) 15 (iii) 30 (iv) 20

8) හිස් කොටුවට ගැළපෙන රූපය අඩංගු පිළිතුර කුමක් ද?



(i)   (ii)   (iii)   (iv) 

9) *A* හා *B* යන ස්ථානවලට ගැළපෙන රූපය හා සංඛ්‍යාව ඇතුළත් පිළිතුර තෝරන්න.




(i) △ 11  (ii) ○ 12  (iii) □ 11  (iv) □ 12

10) මීටර් 12 ක් දිග මීටර් 8 ක් පළල සෘජුකෝණාස්‍රාකාර හැඩැති ඉඩමක් වටා මීටර් 2 ක පරතරයක් සිටින සේ කම්බිකණු සිටුවීමට ඇත. අවශ්‍ය කම්බි කණු ගණන කොපමණ ද?

(i) 19  (ii) 21  (iii) 20  (iv) 18


11) කොළඹ බස්නැවතුමෙන් මිනිත්තු 20 කට වරක් ගාල්ලට ද මිනිත්තු 30 කට වරක් මාතරට ද මිනිත්තු 40 කට වරක් හම්බන්තොටට ද බස්රථ පිටත්වේ. උදෑසන 6.00 ට මෙම නගර තුනටම එකවර කොළඹ බස් නැවතුමෙන් බස්රථ පිටත් වූයේ නම් නැවත එම නගර තුනටම එකවර බස්රථ පිටත් වන්නේ කීයට ද?

(i) පෙ.ව 7.00  (ii) පෙ.ව 8.30  (iii) පෙ.ව 10.00  (iv) පෙ.ව 8.00

12) කොඩි වැලක නිල්, කහ, රතු, සුදු යන වර්ණවලින් කොඩි පිළිවෙළින් ඇත. මෙහි 80 වැනි කොඩියේ වර්ණය කුමක් ද?

(i) කහ  (ii) රතු  (iii) සුදු  (iv) නිල්

13)




ඉහත සටහනට අනුව බස් හිමි අය දැක්වෙන අක්ෂර මොනවාද?


(i) G  (ii) B, E, F  (iii) B, E, F, D  (iv) D, E, F, G

14) අපේ පාසලේ පාපන්දු කණ්ඩායමේ සිටින සියලු දෙනා 11 ශ්‍රේණියේ සිසුන්ය. සුනිමල් ද 11 ශ්‍රේණියේ සිසුවෙකි. " එසේ නම් සුනිමල් ද පාපන්දු කණ්ඩායමේ සිටී " මෙම කියමන

(i) සත්‍යයකි. (ii) අසත්‍යයකි. (iii) නිශ්චිතවම කිව නොහැක. (iv) ඉහත පිළිතුරු එකක්වත් නොවේ.


හරවන්න


15) රටාව හඳුනාගෙන හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(i) 20 (ii)21 (iii)14 (iv)15

16) දී ඇති වස්තු යුගලය ඉහළ සිට බැලූවිට පෙනෙන ආකාරය පිළිතුරු තුළින් තෝරන්න.



(i)  (ii)  (iii)  (iv) 

17) මා ළඟ රු 5 කාසි හා රු 10 කාසි සමාන ප්‍රමාණයක් තිබුණි. රු 5 කාසි ද රු 10 කාසි වූයේ නම් මා ළඟ ඇති මුළු මුදල රු 100 කි. මා ළඟ තිබූ රු 5 කාසි ගණන කොපමණ ද?

(i)10 (ii) 6 (iii)5 (iv)8

18) ක්‍රීඩා පිටියක සිටි 10 දෙනෙකු අතුරෙන් 7 දෙනෙක් කුඩ ඉහලාගෙන සිටියහ. 6 දෙනෙක් හිස්වැසුම් පැළඳගෙන සිටියහ. ඔවුන්ගෙන් සෑම අයෙකුම එක්කෝ කුඩයක් ඉහලාගෙන නැතහොත් හිස්වැසුම් පැළඳ සිටියහ. සමහරු හිස්වැසුම් පැළඳ කුඩද ඉහලාගෙන සිටියහ. එසේ හිස්වැසුම් පැළඳ කුඩද ඉහලාගෙන සිටි සංඛ්‍යාව කීය ද?

(i)3 (ii)7 (iii)6 (iv)10

19) තාත්තා අඹවලට හා අන්නාසි වලට කැමති නමුත් නාරං වලට අකමැතිය. අම්මා නාරංවලට හා අඹ වලට කැමති නමුත් අන්නාසිවලට අකමැතිය. මම දිවුල් වලට හා අඹවලට කැමැත්තෙමි. අප තුන්දෙනාම කැමති පලතුරක් වන්නේ.


(i) දිවුල් ය (ii) දිවුල් හා නාරං ය (iii) නාරං ය (iv) අඹ ය

20) දී ඇති අංක අතර සම්බන්ධතාව තේරුම් ගෙන හිස් කොටුවට සුදුසු අංකය තෝරන්න.

| | | |
|---|---|---|
| 8 | 68 | 2 |
| 5 | ....... | 4 |

(i) 20 (ii) 40 (iii) 41 (iv) 45

21) පහත රූපය පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.




(i)0.2 (ii) 14.4 (iii)0.8 (iv)0.5

22) පහත දැක්වෙන විස්තර වලින් කියැවෙන අකුරු තුනෙහි වචනය ලියන්න.
මුල් අකුර පහනේ ඇත. එහෙත් යහනෙ හි නැත.
දෙවන අකුර වනයේ ඇත. එහෙත් ගැනයෙ හි නැත.
තෙවන අකුර නාහයේ ඇත. එහෙත් දනයෙ හි නැත.

(i) නහය (ii) වනය (iii) පවන (iv) දනය

23) දී ඇති මිනුම් අනුව රූපයේ පරිමිතිය සොයන්න.




(i) 22cm (ii) 16cm (iii) 32 cm (iv) 64cm

24) වැංකියකින් $\frac{2}{3}$ ජලයෙන් පිරී තිබුණි. ඉන් 200$l$ ප්‍රයෝජනයට ගත් පසු දැන් ඇත්තේ වැංකියෙන් $\frac{1}{2}$ කි. වැංකියේ ධාරිතාව කොපමණ ද?

(i) 200$l$ (ii) 400$l$ (iii) 1300$l$ (iv) 1200$l$

25) වැංකියක ධාරිතාව 10$l$ කි. රුවන් වරකට 4$l$ බැගින් දමමින් එම වැංකියට ජලය පුරවයි. එසේ සෑම වාරයකටම පසු ඔහුගේ මල්ලි ලීටර් 2 බැගින් ඉවතට ගනියි. මුලින්ම වැංකිය පිරෙන්නේ සුනිල් කී වරක් ජලය දැමූ පසු ද?

(i) 4 (ii) 6 (iii) 8 (iv) 5


26) ඇතුළත නොපෙනෙන පෙට්ටියක නිල්පාට පෑන් තුනකුත් රතුපාට පෑන් තුනකුත් ඇත. පෑන් දෙස නොබලා එකම පාට පෑන් දෙකක් අනිවාර්යයෙන් ම ලැබීමට පෙට්ටියෙන් ඉවතට ගතයුතු අඩුම පෑන් ගණන කීය ද?

(i) 3 (ii) 2 (iii) 4 (iv) 6

27) 20cm බැගින් දිග ලෝහ පටි කැබලි 4 ක් තනි දිග පටියක් වන සේ කෙළවරවල් පාස්සා ගන්නා ලදී. සෑම පැස්සුමක ම එක් එක් ලෝහ පටියෙන් 5cm බැගින් එක මත එක තැබීමට සිදුවිය. අවසානයට ලැබෙන ලෝහ පටියේ දිග කොපමණ ද?

(i) 80cm (ii) 75cm (iii) 70cm (iv) 65cm

28) පහත දැක්වෙන ඝන වස්තුවෙහි ඇති මුහුණත් ගණන කීය ද?




(i) 14 (ii) 12 (iii) 13 (iv) 10

29) 2019 වර්ෂයේ හරි මැද දිනය යෙදෙන්නේ කවදාට ද?

(i) අගෝස්තු 5 (ii) ජූලි 15 (iii) ජූලි 2 (iv) ජූනි 15

30) පහත මුළු රූපයේ වර්ගඵලය එහි අඳුරුකර ඇති කොටසේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද?



(i) 14 (ii) 12 (iii) 11 (iv) 10

31) ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ තුනෙහි විශාලත්වය අතර අනුපාතය 1:2:3 වේ. කෝණ අනුව එම ත්‍රිකෝණය කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(i) මහාකෝණික ත්‍රිකෝණයකි (ii) සෘජුකෝණික ත්‍රිකෝණයකි

(iii) සමපාද ත්‍රිකෝණයකි (iv) සමකෝණික ත්‍රිකෝණයකි

32) $A$ සිට බලන විට $B$ හි දිගංශය $120^0$ නම්, $B$ සිට බලන විට $A$ හි දිගංශය කොපමණ ද?

(i) $140^0$ (ii) $60^0$ (iii) $120^0$ (iv) $300^0$

33) $3x + y = 11$ හා $2x - y = 4$ නම් $x$ හි අගය කොපමණ ද?

(i) 2 (ii) 1 (iii) 3 (iv) 4

34) පැයට කිලෝමීටර් 36 ක ඒකාකාර වේගයෙන් යන රථයක් පැය 2 මිනිත්තු 15 කදී ගමන් කරන දුර කොපමණ ද?

(i) 81km (ii) 72cm (iii) 51km (iv) 72000m

35) පරිධිය 88$cm$ වන වෘත්තයක අරය කොපමණ ද?

(i) 7cm (ii) 21cm (iii) 14cm (iv) 3.5cm

36) $a^b = b^a$ හා $a \neq b$ වන පරිදි $a$ හා $b$ ට ගතහැකි අගය යුගලක් තෝරන්න.

(i) 1 සහ 1 (ii) 2 සහ 0 (iii) 2 සහ 3 (iv) 2 සහ 4

37) 20% ක වාර්ෂික සුළු පොලියට යම් මුදලක් ණයට ගෙන එම ණයට ගත් මුදලට සමාන මුදලක් පොලිය වශයෙන් ගෙවන්නට සිදුවන්නේ කොපමණ කලකට පසුව ද?

(i) වසර 5 කට (ii) වසර 3 කට (iii) වසර 4 කට (iv) වසර 10 කට

38) පිරිමි ළමුන් තුන්දෙනෙකුගේ ස්කන්ධවල මධ්‍යන්‍යය 42.5kg කි. ගැහැණු ළමුන් දෙදෙනෙකුගේ ස්කන්ධවල මධ්‍යන්‍යය 40.5kg කි. ළමුන් පස්දෙනාගේ මධ්‍යන්‍ය ස්කන්ධය කොපමණ ද?

(i) 50kg (ii) 41.5kg (iii) 41.7kg (iv) 83kg

39) රංගගේ දැන් වයස අවුරුදු 11 කි. ඔහුගේ මවගේ දැන් වයස, රංගගේ වයසේ තුන්ගුණයට වඩා අවුරුදු 3 ක් වැඩිය. තව අවුරුදු 4 කින් මවගේ වයස කොපමණ ද?

(i) අවුරුදු 36 (ii) අවුරුදු 20 (iii) අවුරුදු 32 (iv) අවුරුදු 40

40) වර්ගඵලය $81cm^2$ වන සමචතුරස්‍රයක පරිමිතිය කොපමණ ද?

(i) 40cm (ii) 9cm (iii) 36cm (iv) 20cm